# ත්‍රිපිටකයේ අන්තර්ගත පර්යේෂණ ක්‍රමවේද පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

බෝදාගම සුමන හිමි[1]

## හැඳින්වීම

බුදුදහම පර්යේෂණයක ප්‍රතිඵලයක් ලෙස ලෝකයාට නිරාවරණය කරන ලද දහමකි. ලෝකයේ විධිමත්ව සිදු කරන ලද මුල් ම පර්යේෂණය හැටියට ද, ආර්ය පර්යේෂණයක් ලෙස ද මෙය හැඳින්විය හැකිය. සංයුක්ත නිකාය ප්‍රධානව අරියපරියෙසන, ධම්මචක්කප්පවත්තන, කාලාම, වීමංසක ආදී සූත්‍ර තුළ අන්තර්ගත ගැඹුරු ධර්ම කරුණු ආශ්‍රයෙන් බෞද්ධ පර්යේෂණයේ ස්වභාවය කෙබඳුදැයි විමසීම මෙහි අරමුණයි.

ප්‍රාග් බෞද්ධ යුගයේ සිට ම අද දක්වා ම මානවයා යම් දියුණුවක් ලබාගෙන ඇත්තේ යම් යම් පර්යේෂණයන්ගේ ප්‍රතිඵලයන් ලෙස ය. මේ සෑම පර්යේෂණයක ම ප්‍රතිඵලය වෙනස් වන සුළුය. ස්ථිර නොවේ. ජාති, ජරා, ව්‍යාධි, සෝක, මරණාදී ස්වභාවයේ සිටිමින් එබඳුම ස්වභාවයක් ම සොයනු ලබයි. නමුත් බෞද්ධ පර්යේෂණය වනාහි මෙයින් ඉඳුරා ම වෙනස් වේ. ජාති, ජරා ආදී ස්වභාවයේ සිටිමින් එයින් විනිර්මුක්ත වූවක් ම සොයයි. ඥාන ගවේෂණයේ සිට සත්‍ය ගවේෂණය දක්වා පර්යේෂණය විහිද යයි.

බෞද්ධ පර්යේෂණය ගැටලුව, මූල ධර්ම, උපන්‍යාසය, හේතුඵල සම්බන්ධය, විචල්‍යය, සාධක භාවිතය, මග පෙන්වීම, සාහිත්‍ය ගවේෂණය, ප්‍රශ්නාවලී ගොඩනැංවීම, පර්යේෂකයා සතු විය යුතු ගුණාංග, සාරාංශය, ප්‍රචාරණය, ප්‍රකාශනය ආදි පර්යේෂණ ගුණාංගයන්ගෙන් යුක්ත වේ. එසේම ආමිස, ධර්ම, ආස්වාද, ආදීනව, නිස්සරණ, රූප, කාම, ව්‍යාපාද, විහිංසා, ආර්ය අනාර්යාදි පර්යේෂණ ක්‍රමවේදයන් ද ත්‍රිපිටකයේ දැකගත හැකිය.

බෞද්ධ පර්යේෂණයේ පදනම, ගැටලුව හා මූලධර්ම

බෞද්ධ චින්තනය තුළ ඥානයේ ස්වභාවය හා දැනුමෙහි එකිනෙක ගුණාත්මක වෙනස්කම් නිශ්චිතව උද්දීපනය කොට දැක්වීම සඳහා භාවිත වන කරුණු (05) කි. ඒනම් සඤ්ඤා, විඤ්ඤාණ, පඤ්ඤා, පරිඤ්ඤා, අභිඤ්ඤා යනුවෙනි. යම් දෙයක් හැඳින එය කුමක්දැයි දැන ඒ තුළින් ප්‍රඥාව ඇති කර ගත යුතුය. ඉන් අනතුරුව දැන ගත් දේ නැවත නැවත විමසීමෙන් අවබෝධ කරගත් තැනැත්තෙක් බවට පත් වේ. මේ ලක්ෂණ යම් පුද්ගලයෙක් සතු වේ නම් හෙතම නිරායාසයෙන් ම පර්යේෂකයෙකු බවට පත් වේ. බෞද්ධ පර්යේෂණයේ දී දුක්ඛ

[1] සහකාර පුස්තකාලයාධිපති, නාගානන්ද අන්තර්ජාතික බෞද්ධ අධ්‍යයන ආයතනය, ශ්‍රී ලංකාව.

හෙවත් දුක සියලු මිනිසුන්ගේ පොදු ගැටලුව ලෙස පෙන්වා දෙන්නේ ''දුක්ඛෙ ලොකො පතිට්ඨිතො'' යනුවෙනි.

පර්යේෂකයා තම පර්යේෂණය සිදු කරන විට ඡන්ද, ද්වේශ, භය, මෝහාදියෙන් වියුක්තව විමර්ශනශීලීව, විචක්ෂණව කටයුතු කිරීම සාර්ථක පර්යේෂණයකට මග පාදයි. මේ සඳහා අනුගමනය කරන පිළිවෙත පර්යේෂණ මූලධර්ම ලෙස දැක්විය හැකිය. ත්‍රිපිටකයේ බොහෝ සූත්‍ර දේශනාවන් තුළ යම් දෙයක් විමසන විට තිබිය යුතු ලක්ෂණ මෙන් ම බැහැර කළ යුතු දුර්ගුණයන් ද ඉදිරිපත් කොට ඇත. කාලාම සූත්‍රයේ දී අනුශ්‍රැතිය, පරම්පරාව, මතිමතාන්තර, පෙළෙහි සඳහන් වී තිබීම, තර්කයට හේතුවන, න්‍යායට ගැළපීම, පෙනෙන හැටියට නිවැරදි වීම, තමන් පිළිගෙන ඇති දෘෂ්ටියට ගැළපෙන, පුද්ගල යහපත් බව, තම ගුරුවරයාය යන කරුණු නිසා යමක් සත්‍යය හෝ අසත්‍යය කියා පිළිනොගන්නා ලෙස උපදෙස් දී ඇත. මජ්ඣිම නිකායේ චංකි සූත්‍රයේ දී බුදුන් වහන්සේ චංකි බමුණාට සද්ධා (ශ්‍රද්ධාව), රුචි (කැමැත්ත), අනුස්සව (අනුශ්‍රවය), ආකාරපරිවිතක්ක (විතර්කයට ගැළපීම), දිට්ඨිනිජ්ඣානක්ඛන්ති (තම දෘෂ්ටියට ගැළපීම) යන කාරණාවන්ට අනුව යම් දෙයක් නො විමසන ලෙසට දේශනා කළහ. වීමංසක සූත්‍රයේ දී

1. ග්‍රන්ථ වීමංසක
2. මූල වීමංසක

යනුවෙන් විමසන්නවුන් දෙදෙනෙකු ගැන දේශනා කොට ඇත.

වීමංසක සූත්‍රයේදී පහත දක්වන ආකාරයට විමසසන්නවුන් දෙදෙනා කටයුතු කළ බව දක්වන්නේ මෙසේය.

''තත්‍ර භික්ඛවෙ තථාගතොව උත්තරිං පටිපුච්ඡිතබ්බො''

මෙහි දී මහණෙනි, ග්‍රන්ථ වීමංසකය (සාධක විමසන්නා), මූල වීමංසකය (ශාස්තෘවරයාගෙන් ම අසා දැන ගන්නා) යන වීමංසකයන් අතුරෙහි මූල වීමංසකයා විසින් තථාගතයන් වහන්සේ ම මතුයෙහි පිළිවිසිය යුතු වෙති. පොත් පත් අධ්‍යයනය කිරීම මගින් ග්‍රන්ථ වීමංසකයා ද, සමීපයට ගොස් සම්මුඛ සාකච්ඡා හෝ ප්‍රශ්නාවලි යොමු කිරීමෙන් මූල වීමංසකයා ද සම්මා සම්බුද්ධ ද නැද්ද යන්න විධිමත් විමසිය යුතු බව පෙන්වා දී ඇත.

**උපන්‍යාසය**

යම් දෙයක් මෙසේ විය හැකිය යනුවෙන් කරන ලබන අනුමානය උපන්‍යාසය වේ. බෞද්ධ චින්තනය උපකල්පන හතරක් මත රඳා පවති එනම්

01. දුක්ඛ සත්‍යය - දුකක් ඇත
02. දුක්ඛ සමුදය සත්‍යය - දුකෙහි ඇති වීමක් තිබේ

03. දුක්ඛ නිරෝධ සත්‍යය - දුකෙහි නැති වීමක් ද තිබේ.

04. දුක්ඛ නිරෝධ ගාමිනී පටිපදා සත්‍යය - දුක නැති කිරීමේ මගක් ද ඇත වශයෙනි.

හේතු ඵල සම්බන්ධය (පටිච්චසමුප්පාදය), විචල්‍ය හා සාධක භාවිතය

ඕනෑම පර්යේෂණයක දී අවස්ථා සම්බන්ධය මනාව ගැලපීම කළ යුතු වන්නේ පර්යේෂණයේ සාර්ථකත්වයට, විශ්වසනීයත්වයට එය අත්‍යාවශ්‍ය වන නිසා ම ය. බෞද්ධ දර්ශන තුළ හේතුව හා ඵලය අතර සම්බන්ධයත්, ඵලය හා හේතුව අතර සම්බන්ධයත් මනාව ගළපා ඇත.

"ඉමස්මිං සති ඉදං හොති - ඉමස්සුප්පාදා ඉදං උප්පජ්ජති''

"ඉමස්මිං අසති ඉදං න හොති - ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති"

යනුවෙන් ප්‍රත්‍යය ඇති කල්හි ඵලය ඇති වන බවත් ප්‍රත්‍ය නොමැති විට ඵලයක් නැති බවත් අවිද්‍යාව, සංඛාර, විඤ්ඤාණ ආදිය ඇති විට දුක් දොම්නස් ඇති වීමත්, නැති විට දුක් දොම්නස් නැති වීමෙනුත් මනාව පෙන්වා දී ඇත. බෞද්ධ පර්යේෂණ ක්‍රමවේදයෙහි විචල්‍ය ලෙස සිද්ධි, අවස්ථා භාවිතයට ගෙන ඇත. විචල්‍ය ගණනින් 07 කි. එනම් ජරා, මරණ, සෝක, පරිදෙව, දුක්ඛ, දොමනස්ස, උපායාස යනුවෙනි. බෞද්ධ පර්යේෂණ ක්‍රමවේදයෙහි දී ඉහත දක්වන ලද විචල්‍යයන් වෙනස් වන ආකාරය පිළිබඳ විමසා බලනු ලබයි.

සාධක භාවිතය ( Seeking truth from facts) පර්යේෂණයක දී යොදා ගත යුත්තේ කෙසේ ද යන්න චුල්ලහත්ථිපදොම සූත්‍රයේ දී මනාව පෙන්වා දී ඇත. මෙහි දී ඇතුන් පිළිබඳ මනා අවබෝධයක් ඇති පුද්ගලයෙක් ඇත් පා අනුව ගොස් වැරදි අනුමානයන් නොකොට පා සළකුණු ආදිය විමසා ඇතා දැකම සංතෘෂ්ට වන්නේ ද එපරිද්දෙන් ම බෞද්ධ පර්යේෂකයා කටයුතු කළ යුතු බව දේශනා කරන ලදි.

## ප්‍රශ්නාවලි ගොඩනැංවීම

ප්‍රශ්නාවලි ඉදිරිපත් කිරීම මගින් තොරතුරු ලබා ගැනීම සමාජ විද්‍යාත්මක පර්යේෂණයේ මූලික ලක්ෂණයකි. බෞද්ධ පර්යේෂණ ක්‍රමවේදයේ දී ද ප්‍රශ්න විමසමින් තොරතුරු ලබා ගැනීම දක්නට ලැබේ. බුදුන් වහන්සේ තම ශ්‍රාවකයන්ට යා යුතු මග දැක්වීමට ද බ්‍රාහ්මණ, ක්ෂත්‍රියාදීන් යම් යම් කරුණු කාරණාවන්හි සත්‍ය, අසත්‍යතාවන් දැන ගනු පිණිස ද බුදුන් වහන්සේගෙන් ද ප්‍රශ්න විමසූ අවස්ථා ත්‍රිපිටකයෙහි දක්නට ලැබේ. බුදුන් වහන්සේ අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයේ දී රාහුල හිමියන්ගෙන් ප්‍රශ්න විචාරමින් කාය, මන, වාග් කර්මයන්ගේ පාරිසුද්ධියට එළඹෙන ආකාරය, චංකි සූත්‍රයේ දී චංකි බ්‍රාහ්මණයා බුදුන් වහන්සේගෙන් ප්‍රශ්න විමසා තමා නොදන්නා කාරණාවන් දැනගත් ආකාරය ද දැක්වේ.

**සාරාංශය, ප්‍රචාරණය හා ප්‍රකාශනය**

බුදුරජාණන් වහන්සේ තම පර්යේෂණයේ සාරාංශය ලෙස ධම්මචක්කප්පවත්තන සූත්‍රයේ දී අත්තකිලමථානුයෝගය හා කාමසුඛල්ලිකානුයෝගය හීන, ගම්‍ය ධර්ම බවත් මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කරන ලෙස දේශනා කළහ.

නව දැනුම සොයා ගැනීම පමණක් ප්‍රමාණවත් නොවේ. එසේ පර්යේෂණයකින් සොය ගත් දැනුම මානව වර්ගයාගේ යහපත උදෙසා බෙදා හැරිය යුතුය. වර්තමානයේ විද්‍යුත් මුද්‍රිත මාධ්‍යයෙන් පර්යේෂණ ප්‍රතිඵලය ලොකයාට හඳුන්වා දීමට හැකි වුවද මීට වසර දෙදහස් පන්සියයකට පෙර සිදු කරන ලද බෞද්ධ පර්යේෂණයේ ප්‍රතිඵල ප්‍රචාරය කිරීම පහත පරිදි සිදු කොට ඇත. ආචික්ඛන (පැවසීම), දෙසන (දේසනා කිරීම), පඤ්ඤපන (පැනවීම), පට්ඨපන (පිහිටුවීම), විවරණ (විස්තරාත්මකව දැක්වීම), විභජන (බෙදා දැක්වීම), උත්තානීකම්ම (ඉස්මතු කර පෙන්වීම) යන ක්‍රමවේදයන් මගිනි. බුද්ධත්වය අවබෝධ කරගැනීමෙන් අනතුරුව තමන් වහන්සේ පෙර නො ඇසූ විරූ තත්වයකට එනම් බුද්ධත්වයට පත් වූ බව බුදුරදහු ලෝකයාට ප්‍රකාශ කළහ. මෙසේ පර්යේෂණයක ප්‍රතිඵලයක් ලෝකයාට ප්‍රකාශ කිරීමෙන් අනතුරුව එහි ප්‍රතිඵලය වාචනා මාර්ගයෙන් බෝහෝ තැන්වල ප්‍රචලිත විය. මෙසේ කට වචනයෙන් ඉතා කෙටි කලක් තුළ මෙතරම් පිරිසක් දැන ගත් වෙනත් පර්යේෂණ ප්‍රතිඵලයක් දැකගත නොහැක. අකණිට්ඨක බ්‍රහ්ම ලෝකය දක්වා කට වචනයෙන් මෙම බෞද්ධ පර්යේෂණයේ ප්‍රතිඵලය පැතිර ගොස් ඇති බව පෙනේ.

**නිගමනය**

බෞද්ධ පර්යේෂණ ක්‍රමවේදය පර්යේෂණ ගුණාංගයන්ගෙන් හෙබි ආර්ය හෙවත් උතුම් පර්යේෂණයක් ලෙස හැඳින්විය හැකිය.

**ප්‍රමුඛ පද :** බෞද්ධ පර්යේෂණය, ආර්ය, ගවේෂණය, ප්‍රාග් බෞද්ධ, ත්‍රිපිටකය

**ආශ්‍රිත ග්‍රන්ථ**

ස.නි. v.i, (2013) *ධම්මචක්කප්පවත්තන සූත්‍රය*, ධර්ම චක්‍ර ළමා පදනම, බු. ජ. මු, පි. 270 - 275.

ම.නි. i, (2013). *චංකි සූත්‍රය*, ධර්ම චක්‍ර ළමා පදනම , බු. ජ. මු, පි. 646 -668.

ම.නි. i, (2013). *අරියපරියෙසන සූත්‍රය*, ධර්ම චක්‍ර ළමා පදනම, බු. ජ. මු, පි. 394 -424.

අං.නි. i, (2013). *කාලාම සූත්‍රය*, ධර්ම චක්‍ර ළමා පදනම, බු. ජ. මු, පි. 336 - 345.

ධම්මපාල හිමි, ගතාරේ (1984). *පර්යේෂණ ක්‍රම විද්‍යාව*. දෙහිවල: තිසර ප්‍රකාශකයෝ.